යොමුව-නාරා/පාලන/2021/215/RL/ටෙන්ඩර් අංක 89

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත , මට්ටක්කුලිය ,කොළඹ-15

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදල් තැන්පතුවක් අධ්‍යක්ෂ ජනරාල්/නාරා වෙත තැන්පත් කිරිමෙන් පසුව අධ්‍යක්ෂක/මුදල් නාරා වෙතිනි.

01.අවශ්‍ය කෙරෙන වාහන පංති,ගමන් මාර්ග හා අනෙකුත් පිරිවිතරයන් පහත දක්වා ඇත.කොන්ත්‍රාත් කාලය එක් වසරක් වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගය ක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | වාහන පංතිය |
|---|---|---|---|---|---|
| මීගමුව-නාරා | මීගමුව බස් නැවතුම් පොළ ඉදිරිපිට සිට ජා-ඇල , කදාන , මහබාගේ ,ගුණසේකර මාවත , කෙරවලපිටිය , හරහා ඇලකන්ද මට්ටක්කුලිය නව පාලම ඔස්සේ නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම මීගමුව බස් නැවතුම්පොළ දක්වා . | කි.මී 32 | පෙ.ව 07.00 ට මීගමුව බස් නැවතුම් පොළ ඉදිරිපිට සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | ආසන 40 ට නොඅඩු ඩීසල් වාහනයක් |
| කොට්ටාව-නාරා | කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් ඉදිරිපිට සිට අතුරිගිරිය පාර ඔස්සේ වල්ගම හන්දිය ,ඥානවිමළ මාවත,අතුරිගිරිය, අතුරිගිරිය පාර,මාළඹේ,කොස්වත්ත,අග්ගොන,වල්පොළ පාර,රෝහල පාර,අංගොඩ,ශ්‍රී සුමන මාවත ,කැළණිමුල්ල,කැළණි විහාරය,බියගම පාර,4 කණුව,නුවර පාර ,පෑලියගොඩ වට රවුම,වික්ටෝරියා පාලම,තොටළග,ෆර්ගියුසන් පාර , විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ නාරා ප්‍රධාන කාර්යාලය දක්වා හා ආපසු එම මාර්ගයේම කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් දක්වා | කි.මී 28 | පෙ.ව 06.55 ට කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් ඉදිරිපිට සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | ආසන 29 ට නොඅඩු ඩීසල් වාහනයක් |
| බොරැල්ල-නාරා | බොරැල්ල ළමා රෝහල ඉදිරිපිට සිට බේස්ලයින් පාර,දෙමටගොඩ , | කි.මී 7.5 | පෙ.ව 07.45 ට බොරැල්ල | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය | ආසන 29 ට නොඅඩු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඔරුගොඩවත්ත,ස්ටේස් පාර, කොස්ගස් හන්දිය,ශාන්ත ජෝසප් විදිය, ඉගුරුකඩේ හන්දිය, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත , තොටලග ෆර්ගියුසන් පාර හරහා නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම බොරැල්ල මංසන්ධිය දක්වා. | | ළමා රෝහල ඉදිරිපිට සිට | නාරා ප්‍රධාන කාර්යාලයෙන් | **ඩීසල් වාහනයක්** |
| නිට්ටඹුව-නාරා | නිට්ටඹුව බස් නැවතුම අසල සිට නුවර පාර,මිරිස්වත්ත හන්දිය ,කඩවත , කිරිබත්ගොඩ,පූජ්‍ය උයන්වත්තේ ඥාණාලෝක මාහිමි මාවත (නව හුණුපිටිය පාර) , හුණුපිටිය ,වත්තල, හරහා හේකිත්ත පාර හරහා නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම නිට්ටඹුව බස් නැවතුම දක්වා. | **කි.මී 37.7** | **පෙ.ව 06.40 ට නිට්ටඹුව බස් නැවතුම අසල සිට** | **ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන්** | **ආසන 54 ට නොඅඩු ඩීසල් වාහනයක්** |
| නාරා-කළුතර | උදෑසන-<br>කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර) අලුත් මාවත පාර , විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය.<br><br>සවස-<br><br>නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර , අලුත්මාවත පාර,කේ සිරිල් සී පෙරේරා මාවත ,බ්ලූමැන්ඩල් පාර,ආමර් විදිය,පංචිකාවත්ත,මරදාන දුම්රිය පොළ, ටෙක්නිකල් හන්දිය , පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ කළුතර බස් නැවතුම දක්වා. | **උදෑසන ගමන් වාරය-කි.මී 50.0**<br><br>**සවස ගමන් වාරය-කි.මී 52.7** | **පෙ.ව 06.45 ට කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග තදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ) කොටුව මල්වත්ත පාරට උදෑසන 08.05 වන විට පැමිණිය යුතුවේ. එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කල යුතුය.** | **ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන්** | **ආසන 48 ට නොඅඩු ඩීසල් වාහනයක්** |

**02.**ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2022 **මැයි** මස 30 තෙක් විය යුතුය.

**03.** ලංසු ඉදිරිපත් කිරීමේදී එක් ප්‍රවාහන සේවාවක් සදහා ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් සමග පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

**04.**ලංසු ඉදිරිපත් කිරීමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරීම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05.** එක් ප්‍රවාහන සේවාවක් සදහා හෝ ප්‍රවාහන සේවා කීපයක් සදහා හෝ ප්‍රවාහන සේවා සියල්ලම සදහා හෝ ලංසු ඉදිරිපත් කළ හැකිය.එක් ලංසු ආකෘතියක් මගින් ලංසු ඉදිරිපත් කළ හැක්කේ එක් ප්‍රවාහන සේවාවක් සදහා පමණි.

06.**අදාළ වන්නා වූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය නිකුත් කරනු ලබන්නේ 2021 දෙසැම්බර් 31සිට 2022 ජනවාරි මස 19 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2022 ජනවාරි මස 12 වන දින පෙ.ව 10.00 ට නාරා අධ්‍යක්ෂක ජනරාල් කාර්යාලයේදී පැවැත්වේ.**

**07.මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2022 ජනවාරි මස 20 වන දින ප.ව 02.00 ට පෙර සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂන සහ සංවර්ධන නියෝජිතායතනනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ**-15 **යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය**.

**ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා කාර්ය මණ්ඩළ ප්‍රවාහන සේවා සදහා මිළ ගණන් කැදවීම-2022/ටෙන්ඩර් පෙට්ට් අංක-** 01" **යනුවෙන් සදහන් කළ යුතුය**.

08.**2022 ජනවාරි මස 20 වන දින ප.ව 02**.00 **ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ** (**නාරා**) **මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.**

**09**.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, අධ්‍යක්ෂක/පාලන හා මානව සම්පත් හා ප්‍රසම්පාදන නිළධාරි
වෙතින් ලබා ගත හැකිය.
ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ15-

දිනය-2021 දෙසැම්බර් මස 31